# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,445 - 2025 ජූලි මස 11 වැනි සිකුරාදා - 2025.07.11**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී. )


# IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත. )


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... | 930 |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... | 934 |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් | |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12. 00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 අගෝස්තු මස 01 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2025 ජූලි මස 18 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට්* පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය. "

2025 ජූනි මස 09 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**එස්. ඩී. පාඩිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති (වැ. බ.)

මෙම *ගැසට් පත්‍රය* *www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


929 - B 082700 — 5,403 (2025/07)
F 1 -

# තනතුරු - ඇබෑර්තු

## මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

මධ්‍යම පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු වී ඇති විෂයානුබද්ධ විශේෂඥ තනතුර සඳහා අයදුම්පත් කැඳවීම

මධ්‍යම පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවතින විෂයානුබද්ධ විශේෂඥ තනතුරට පත් කිරීම සඳහා දැනට රාජ්‍ය සේවයෙහි හා පළාත් රාජ්‍ය සේවයෙහි, සේවයේ නියුතු ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ I ශ්‍රේණියේ සුදුසුකම්ලත් නිලධාරීන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *අවශ්‍ය සුදුසුකම්.-*

i. ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ I ශ්‍රේණියේ අවම වශයෙන් වසර 03ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කළ නිලධාරියෙකු වීම.

ii. දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධරයන් වෙතින් පමණක් අයදුම්පත් කැඳවනු ලබන බැවින් වයස් සීමාවක් අදාළ නොවේ.

iii. අයදුම්පත් භාර ගන්නා අවසන් දින වනවිට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

iv. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හා 01/2020 (I) හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

02. *බඳවා ගැනීමේ ක්‍රමය.-*

මෙම නිවේදනයේ දක්වා තිබෙන සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ I ශ්‍රේණියේ අයදුම්කරුවන් අතුරින් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත, ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයා ඉහත පුරප්පාඩුව සඳහා බඳවා ගනු ලැබේ.

(අනුමත ලකුණු නිර්ණායක www.psc.cp.gov.lk යන වෙබ් අඩවියෙහි පළ කර ඇත.)

***සටහන.-*** සුදුසුකම් සනාථ කෙරෙන සියලුම සහතිකවල සහතික කරන ලද ඡායා පිටපත්, ජාතික හැඳුනුම්පතේ හා උප්පැන්න සහතිකයේ සහතික කරන ලද ඡායා පිටපත් අයදුම්පත සමඟ අමුණා එවිය යුතුය.

*අයදුම්පත් ඉදිරිපත් කිරීම.-*

- විධිමත්ව හා නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත්, දෙපාර්තමේන්තු ප්‍රධානියා සහ අදාළ අමාත්‍යාංශ ලේකම්වරයා මඟින් (පළාත් සභාවට අන්තර්ග්‍රහණය වූ නිලධරයෙකු නම් ඔබගේ අයදුම්පත පළාත් අමාත්‍යාංශ ලේකම් හා ප්‍රධාන ලේකම් ගේ නිර්දේශ සහිතව යොමු කළ යුතුය) **“ ලේකම්, මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 244, කටුගස්තොට පාර, මහනුවර ”** යන ලිපිනයට **2025.08.01 දින හෝ ඊට පෙර** ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

- අයදුම්පත බහාලන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ **“ මධ්‍යම පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ විෂයානුබද්ධ විශේෂඥ තනතුර සඳහා අයදුම්පත් කැඳවීම ”** යනුවෙන් සඳහන් කළ යුතුය.

- නියමිත දිනට පසු ලැබෙන අයදුම්පත්, අසම්පූර්ණ අයදුම්පත් හා අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට නියමිත සුදුසුකම් සපුරා නොමැති නිලධාරීන්ගේ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

- අයදුම්පත් ප්‍රමාද වීම හෝ නැති වීම පිළිබඳ කිසිදු පැමිණිල්ලක් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව භාර ගනු නොලැබේ. (ආදර්ශ අයදුම්පත්‍රයක් www.psc.cp.gov.lk යන වෙබ් අඩවියෙන් බාගත කර ගත හැකිය.)

04. මෙම බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙහි විධිවිධාන සලසා නොමැති සියළුම කරුණු පිළිබඳ තීරණ ගැනීමේ බලය මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

05. මෙම දැන්වීමේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර, යම් පරස්පරතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේය.

මෙයට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

සුජානි ආර්. විජේතුංග,
ලේකම් (*වැ.බ.*),
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2025 ජූලි මස 04 වැනි දින,
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

(ආදර්ශ අයදුම්පත්‍රය)

**මධ්‍යම පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ විෂයානුබද්ධ විශේෂඥ තනතුර සඳහා අයදුම්පත්‍රය**

01. මුලකුරු සමඟ නම -……………………………………………………………..............................(මයා/මිය/මෙනවිය)

02. i. දැනට දරන තනතුර -……………………………………...........................……………………………………………
ii. සේවය හා ශ්‍රේණිය -…………………………………………………………………........................…………………
iii. දැනට සේවය කරන ආයතනය හා ලිපිනය -………………………………………………….........................……………
……………………………………………………………………....……………….................................

03. පෞද්ගලික ලිපිනය -…………………………………..........................…………………………………………………

04. ස්ත්‍රී/පුරුෂ භාවය -………………………………………………

05. i. උපන් දිනය -………………………………………………

ii. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස -……………………………………………...

06. ජාතික හැඳුනුම්පත් අංකය -………………………………………………

07. දුරකථන අංකය - i. පෞද්ගලික -…………………….......………  ii. රාජකාරි -……………….......…........…………

08. ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ I ශ්‍රේණියට උසස් වූ දිනය - …..............................…………

09. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට I ශ්‍රේණියේ සක්‍රීය සේවා කාලය -

අවුරුදු :..........…, මාස :...........…, දින :.......….....

10. තනතුරට අදාළ ක්ෂේත්‍රයේ අධ්‍යාපන සුදුසුකම් :

| *අනු අංකය* | *පශ්චාත් උපාධි/ පශ්චාත් ඩිප්ලෝමා* | *ලබා දුන් ආයතනය* | *වර්ෂය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

11. රාජ්‍ය සේවයේ මුල්පත්වීමේ සිට අයදුම්පත් භාර ගන්නා අවසන් දින දක්වා සේවා කාලයට අදාළ විස්තර :

| අනු අංකය | ආයතනය | දරන ලද තනතුර හා එම තනතුරට අදාළ ශ්‍රේණිය | කාලය | |
|---|---|---|---|---|
| | | | සිට | දක්වා |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

12. සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය ක්ෂේත්‍රයට දක්වන ලද "කුසලතාවය" පිළිබඳ විස්තර :

i. වාර්ෂික කාර්යය සාධන ඇගයුම :

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පූර්වාසන්න වසර 05 තුළ ලබා ඇති කාර්යය සාධන මට්ටම පිළිබඳ විස්තර :
(අදාළ නොවන වචන කපා හරින්න.)

| වර්ෂය | ලබා ඇති කාර්යය සාධන මට්ටම |
|---|---|
| 2020 | විශිෂ්ඨ / සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළ / සතුටුදායක |
| 2021 | විශිෂ්ඨ / සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළ / සතුටුදායක |
| 2022 | විශිෂ්ඨ / සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළ / සතුටුදායක |
| 2023 | විශිෂ්ඨ / සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළ / සතුටුදායක |
| 2024 | විශිෂ්ඨ / සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළ / සතුටුදායක |

ii. විෂයානුබද්ධ දැනුම/අත්දැකීම් :
(වෙබ් අඩවියේ පළකරන ලද ලකුණු නිර්ණායකයන්හි 02.3.1 හි සඳහන් කර ඇති පරිදි)

| අනු අංකය | විෂයානුබද්ධ දැනුම/අත්දැකීම් | කාලසීමාව |
|---|---|---|
| | | |
| | | |
| | | |

iii. මූල්‍ය කළමනාකරණය හා පරිපාලන කටයුතු පිළිබඳ දැනුම/අත්දැකීම් :
(වෙබ් අඩවියේ පළකරන ලද ලකුණු නිර්ණායකයන්හි 02.3.2 යටතේ සඳහන් කර ඇති පරිදි)

| අනු අංකය | මූල්‍ය කළමනාකරණය හා පරිපාලන කටයුතු පිළිබඳ දැනුම/අත්දැකීම් | කාලසීමාව |
|---|---|---|
| | | |
| | | |
| | | |

iv. නිර්මාණශීලී ප්‍රකාශන හා ව්‍යාපෘති :
(වෙබ් අඩවියේ පළකරන ලද ලකුණු නිර්ණායකයන්හි 02.4 යටතේ සඳහන් කර ඇති පරිදි)

| අනු අංකය | පළ කරන ලද ප්‍රකාශනය/ව්‍යාපෘතිය | අදාළ කාණ්ඩය |
|---|---|---|
| | | |

v. *වෙනත් සුදුසුකම් :*

I. ප්‍රශංසා
( " පොදු 230බී " ආකෘතිය මගින් ලබා දී ඇති ප්‍රශංසා සඳහා පමණක් මේ යටතේ ලකුණු ලබා දෙනු ලැබේ.)

| *අනු අංකය* | *ලබා ඇති ප්‍රශංසාව* | *ප්‍රශංසාව ලැබුණේ* | | *ක්ෂේත්‍රයට අදාළ කුමන කාර්යයක් වෙනුවෙන් ප්‍රශංසාව හිමිවූයේද යන්න* |
|---|---|---|---|---|
| | | *කාගෙන්ද යන්න* | *වර්ෂය* | |
| | | | | |
| | | | | |
| | | | | |

II. පළාත්/ජාතික මට්ටමේ ජයග්‍රහණ :
(වෙබ් අඩවියේ පළකරන ලද ලකුණු නිර්ණායකයන්හි 02.5.1 හි සඳහන් කර ඇති පරිදි)

| *අනු අංකය* | *ජයග්‍රහණය පිළිබඳ තොරතුරු (කුමන කරුණකට අදාළවද යන වග)* | *පළාත්/ජාතික/අන්තර්ජාතික ජයග්‍රහණයක්ද යන වග* | *ලබාදෙන ලද ආයතනය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

මා හට විරුද්ධව දැනට විනය පරීක්ෂණයක් නොපැවැත්වෙන බවත්, අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට පූර්වාසන්න පස් වසරක කාල සීමාවක් තුළ ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩයේ සඳහන් I හෝ II වන උපලේඛන යටතේ සිදුකරනු ලැබූ වරදකට දඬුවම් නොලැබූ අයෙකු බවත්, ඉහත සඳහන් කර ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි ඒවා බවත් මෙයින් සහතික කරමි.

..............................................
අයදුම්කරුගේ අත්සන.

දිනය : ..........................

**අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය :**

ඉහත සඳහන් තොරතුරු ඉදිරිපත් කර ඇති ............................................................ නිලධාරියාගේ/නිලධාරිණියගේ පෞද්ගලික ලිපිගොනුව පරීක්ෂා කර බැලූ බවත්, ඒ අනුව එම තොරතුරු නිවැරදි බවට සහතික කරන අතර, මෙම නිලධාරියා/නිලධාරිණිය විසින් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පූර්වාසන්න පස් වසරක කාලසීමාව තුළ නියමිත වැටුප් වර්ධක උපයාගෙන ඇති බවත්, රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හා 01/2020(I)හි සඳහන් ආකාරයේ කිසිදු විනයානුකූල දඬුවමකට ලක් නොවූ බවත්, මෙම අයට විරුද්ධව යම් විනයානුකූල ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බවත් හා ඉදිරියේ දී එවැනි ක්‍රියාමාර්ගයක් ගැනීමට අදහස් නොකරන බවත් සහතික කරමි. නිලධාරියා/නිලධාරිණිය තෝරා ගනු ලැබුවහොත් නිදහස් කිරීමට එකඟ වෙමි.

දිනය : ......................

.......................................................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
නම : .................................
නිලමුද්‍රාව : ........................

**අදාළ අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය :**

උක්ත අයදුම්පත්‍රය මා විසින් නිර්දේශ කරමි / නොකරමි.

.................................
දිනය

..............................................
අමාත්‍යාංශ ලේකම්ගේ අත්සන.
නම : ................................
නිලමුද්‍රාව : ........................

**පළාත් ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය :** ( පළාත් සභාවලට අන්තර්ග්‍රහණය කර ඇති නිලධාරීන් සඳහා පමණි.)

උක්ත අයදුම්පත්‍රය මා විසින් නිර්දේශ කරමි / නොකරමි.

දිනය :......................

....................................................
පළාත් ප්‍රධාන ලේකම්ගේ අත්සන.
නම : ........................................
නිලමුද්‍රාව : ................................

07 - 665

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

මධ්‍යම පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර

තාක්ෂණික සේවා ගණයෙහි කෘෂිකර්ම උපදේශක III ශ්‍රේණිය සඳහා වන විවෘත බඳවා ගැනීම - 2025

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයෙහි කෘෂිකර්ම උපදේශක III වන ශ්‍රේණියේ තනතුරට අදාළ පුරප්පාඩු පිරවීම සඳහා මධ්‍යම පළාත තුළ පදිංචි සුදුසුකම්ලත් ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශවයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ.

**02.** **වැටුප් පරිමාණය :**

2025.03.25 දිනැති අංක 10/2025 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි MN 03-2025 වැටුප් කේතය මෙම තනතුරට හිමි වන අතර, එයට අදාළ වැටුප් පරිමාණය රු. 52,250 – 10X800 – 11X1,190 – 10X1,320 – 10X1,350 – 100,040/- ක් වන අතර පත්වීම ක්‍රියාත්මක වන දින සිට ඔබට මෙම චක්‍රලේඛයේ උපලේඛන III හි විධිවිධාන පරිදි වැටුප් ගෙවනු ලැබේ.

**03.** **සේවා කොන්දේසි :**

2.1 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට ඔබ යටත් විය යුතුය.

2.2 මෙම තනතුරට බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලබන අපේක්ෂකයින් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්ව මෙම සේවයට පත් කරනු ලැබේ.

2.3 තනතුරට බඳවා ගැනීමෙන් පසු මධ්‍යම පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ කෘෂිකර්ම උපදේශක තනතුරු සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ දැක්වෙන ආකාරයට අදාළ කාර්යක්ෂමතා කඩඉම් හා රාජ්‍ය භාෂා ප්‍රවීණතා විභාගවලින් සමත්විය යුතුය.

2.4 මෙම තනතුරට පත් කිරීමෙන් අනතුරුව මධ්‍යම පළාත තුළ වසර 05ක අවම සේවා කාලයක් අනිවාර්යයෙන් සේවය කළ යුතු අතර, එම කාලය තුළදී මධ්‍යම පළාතෙන් පිටතට ස්ථාන මාරු ලබා ගැනීමට කරනු ලබන කිසිදු ඉල්ලීමක් සලකා බලනු නොලැබේ. තවද, පත් කරනු ලබන සේවා ස්ථානයේ වැඩ භාරගත් දින සිට අවුරුදු 03ක අවම සේවා කාලයක් අනිවාර්යයෙන්ම සේවය කළ යුතුය.

2.5 මෙම තනතුරට බඳවා ගැනීමෙන් පසු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට, මධ්‍යම පළාත් මූල්‍ය රීති සංග්‍රහයට, මධ්‍යම පළාත් තාක්ෂණික සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයට ,කාර්ය පරිපාටික රීති සංග්‍රහයටද , මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් පනවනු ලබන රෙගුලාසිවලට නොහොත් නියෝගවලටද, මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කල පනවනු ලබන වෙනත් රෙගුලාසි නොහොත් නියෝගවලට ද, අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු නියෝගවලටද අනුව කටයුතු කළ යුතුය.

**04. පවත්නා පුරප්පාඩු ක්ෂේත්‍රයන් :**

3.1 මධ්‍යම පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ කෘෂිකර්ම උපදේශක III ශ්‍රේණියේ පුරප්පාඩු තනතුරු 25ක් සඳහා බඳවා ගැනීම් සිදු කරනු ලබන අතර, මෙම තනතුරෙහි පුරප්පාඩු සඳහා බඳවා ගැනීම සම්බන්ධයෙන් අවසාන තීරණය මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

4.2 අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය **2025.07.31** දින වේ. අයදුම් කරන තනතුරට අදාළ සියලු සුදුසුකම් 2025.07.31 දින හෝ එදිනට පෙර සම්පූර්ණ කර තිබිය යුතුය.

**05. සුදුසුකම් :**

5.1 අධ්‍යාපන සුදුසුකම්.-

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගයේ කෘෂි විද්‍යාව, ජීව විද්‍යාව, රසායන විද්‍යාව, උද්භිද විද්‍යාව, භෞතික විද්‍යාව, සත්ත්ව විද්‍යාව යන විෂයයන්ගෙන් විෂයයන් 02ක් ඇතුළුව විද්‍යා විෂයයන් 03කින් එකවර සමත්වීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි හැර)

*හෝ*

තාක්ෂණවේදය විෂයය ධාරාවට අයත්, ජෛව පද්ධති තාක්ෂණවේදය, තාක්ෂණවේදය සඳහා විද්‍යාව යන විෂයයන් දෙක (02) සහිතව විෂයන් 03කින් එකවර සමත්ව තිබීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි හැර)

*සහ*

සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් සහිතව විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය එක වර සමත්ව තිබීම.

5.2 වෘත්තීය සුදුසුකම්.-

I. තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් විසින් පිරිනමනු ලබන කෘෂිකර්මය පිළිබඳ දෑ අවුරුදු ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම ;

*හෝ*

II. තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් විසින් පිරිනමනු ලබන කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාළ ජාතික වෘත්තීය කුසලතා NVQ 06 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම ;

*හෝ*

III. අම්පාර හාඩි කාර්මික ආයතනය විසින් පිරිනමනු ලබන කෘෂිකර්මය පිළිබඳ ජාතික ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම ;

*හෝ*

IV. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් කෘෂිකාර්මික සහතික නිකුත් කරන ආයතන වලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් කෘෂිකාර්මික සුදුසුකම් වලට සියලු අතින් සමාන යැයි තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් කෘෂිකාර්මික සුදුසුකම් ලබා තිබීම.

5.3 පළපුරුද්ද - අදාළ නොවේ.

5.4 කායික සුදුසුකම්.-

සෑම අපේක්ෂකයෙකුම මධ්‍යම පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමට යෝග්‍ය වන යහපත් කායික , මානසික සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.

5.5 වෙනත් සුදුසුකම්.-

I. අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

II. අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

III. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට (2025.07.31) පූර්වාසන්නයෙන් වූ වසර 03ක කාලය තුළ මධ්‍යම පළාත තුළ ස්ථිර පදිංචිකරුවකු විය යුතුයි. (අයදුම්කරු මෙම පළාතේ වසර 03කට වඩා ස්ථිර පදිංචි අයෙකු සමඟ විවාහ වූ විට කලත්‍රයාගේ ස්ථිර පදිංචිය සලකා බැලේ.)

IV. යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තෙකු මෙම තනතුරුවලට ඉල්ලුම් කිරීම සඳහා සුදුසුකම් නොලබයි.

V. සේවයට බඳවා ගැනීම සඳහා වන තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු අදාළ සියලු සුදුසුකම් හා නියමිත වයස් සීමාව 2025.07.31 දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

**06. වයස් සීමාව :**

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට (2025.07.31) වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.

**07. විභාගය පිළිබඳ විස්තර :**

I. මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අයදුම්කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

II. අපේක්ෂකයා විභාගයේ දී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතුය.

III. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් විය යුතුය.

IV. විභාග මධ්‍යස්ථානය - මහනුවර දී පමණක් පවත්වනු ලැබේ.

V. අයදුම්පත සම්පූර්ණ කිරීමේදී ආබාධිත අයදුම්කරුවන් තම ආබාධය හා එම ආබාධය පිළිබඳ විස්තර ඇතුළත් කළ යුතු අතර, ආබාධිත නොවන අයෙකු සාවද්‍ය ලෙස ආබාධිතයි ලෙස සඳහන් නොකළ යුතුය.

**08. බඳවා ගැනීමේ ක්‍රමය :**

ලිඛිත තරග විභාගයක සහ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.ලිඛිත තරග විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණු වල කුසලතාවයේ අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර සුදුස්සන් තෝරා ගනු ලැබේ.

**09. විභාගය සඳහා වන විෂය නිර්දේශය :**

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40% |
| තාක්ෂණික ප්‍රශ්න පත්‍රය | පැය 02 | 100 | 40% |

| *ප්‍රශ්න පත්‍රය* | *විෂය නිර්දේශය* |
|---|---|
| බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවය, විශ්ලේෂණ හැකියාව, කාල කළමනාකරණය , විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්තය. |

| *ප්‍රශ්න පත්‍රය* | *විෂය නිර්දේශය* |
|---|---|
| තාක්ෂණික ප්‍රශ්න පත්‍රය | 1. ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා කෘෂිකර්මාන්තයේ දායකත්වය<br>2. ශ්‍රී ලංකාවේ දේශගුණික කලාප පිළිබඳ දැනුම<br>3. පස සහ ශාක පෝෂණය<br>4. වී නිෂ්පාදනය<br>5. වෙනත් ක්ෂේත්‍ර බෝග නිෂ්පාදනය<br>6. එළවළු නිෂ්පාදනය<br>7. පළතුරු<br>8. බෝග ආරක්ෂණය<br>9. පාංශු රසායනය , පාංශු සංරක්ෂණයේ වැදගත්කම හා විවිධ පාංශු සංරක්ෂණ ක්‍රම<br>10. වාරි මාර්ග ක්‍රම හා ජල කළමනාකරණය.<br>11. ගොවිපල යාන්ත්‍රීකරණය<br>12. මී මැසි පාලනය<br>13. මල් වගාව හා භූමි අලංකරණය<br>14. ආරක්ෂිත බෝග වගාව<br>15. සත්ත්ව පාලනය<br>16. කෘෂිකාර්මික ව්‍යාප්තිය<br>17. පටක රෝපණය<br>18. පැලෑටි නිරෝධායනය පිළිබඳ දැනුම<br>19. *(අ)* ශාක සංරක්ෂණයේ වැදගත්කම (ශාක/ජාන ප්ලාස්ම)<br>*(ආ)* ශාක සංරක්ෂණ ක්‍රම (ශාක/ජාන ප්ලාස්ම)<br>20. ජාන තාක්ෂණය<br>21. කෘෂිකර්ම සංවර්ධනය<br>22. වර්තමාන කෘෂිකර්ම සංවර්ධන ප්‍රතිපත්ති,ඒවායේ ඇති වැදගත්කම |

**10.** ***අයදුම්කළ යුතු ක්‍රමය :***

I. අයදුම්පත්‍රය මෙම නිවේදනයට යා කොට ඇති ආදර්ශ ආකෘතියට අනුකූලව කඩදාසියේ දෙපසම භාවිත කරමින් A4 ප්‍රමාණයේ කඩදාසිවල පිළියෙල කර අපේක්ෂකයා තම අත් අකුරින් ම පැහැදිලිව පිරවිය යුතුය. අංක 01 සිට 04 තෙක් පළමු පිටුවට ද, අංක 05 සිට 07 තෙක් දෙවන පිටුවට ද, අංක 08 සිට 12 තෙක් තෙවන පිටුවට ද, ඉතිරිය සිව්වන පිටුවට ද, වන සේ සකස් කළ යුතුය. සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතුය. නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අයදුම්පත්‍ර, අසම්පූර්ණ තත්වයේ පවතින අයදුම්පත්‍ර සහ නිවේදනයේ සඳහන් පරිදි මූලික සුදුසුකම් නොමැති බව අයදුම්පත්‍රයේ තොරතුරු අනුව පෙනී යන්නේ නම් ද කිසිදු දැනුම්දීමකින් තොරව එම අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරා ගත යුතුය. සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ඔබ ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක.

II. අයදුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කළ යුතුය.

III. සෑම අපේක්ෂකයෙකුම රු 600.00 ක විභාග ගාස්තුවක් මධ්‍යම පළාත් සභාවට ගෙවිය යුතුය. මෙම විභාග ගාස්තුව මධ්‍යම පළාතේ ප්‍රධාන ලේකම්වරයාගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 ට බැරවන පරිදි අයදුම්පත්‍ර භාරගනු ලබන අවසාන දිනට හෝ ඊට ප්‍රථම මධ්‍යම පළාත තුළ පිහිටි ඕනෑම **ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක**ට මුදලින් ගෙවා, ඒ සඳහා ලබාගත් නිල් පැහැති ලදුපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. වෙනත් ශීර්ෂයකට ගෙවීම් කරන ලද කුවිතාන්සි හෝ මධ්‍යම රජයට අයත් කහ පැහැති කුවිතාන්සි අලවා ඇතොත් එම අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප කරනු ලැබේ. එහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. එකී ලදුපත නොමැතිව එවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරන අතර, විභාගය සඳහා ගෙවන ලද විභාග ගාස්තුව කිසිදු හේතුවක් මත හෝ ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ නොකෙරේ. තව ද විභාග ගාස්තුව සඳහා මුද්දර හෝ මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

IV. අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු හෝ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 ශ්‍රේණිගත කිරීමට අනුව තෘතීය හෝ ජ්‍යෙෂ්ඨ මට්ටමේ රජයේ/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

V. අයදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුව නිවැරදිව සම්පූර්ණ කොට **2025.07.31** දිනට හෝ ඊට පෙර ලැබෙන සේ **'ලේකම්,මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 244, කටුගස්තොට පාර, මහනුවර'** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙලවරේ **"මධ්‍යම පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයෙහි කෘෂිකර්ම උපදේශක III ශ්‍රේණියට බඳවා ගැනීම - 2025"**යනුවෙන් සඳහන් කළ යුතුය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේදී අස්ථානගත වන අයදුම්පත් සම්බන්ධයෙන් මෙම කොමිෂන් සභාව වග කියනු නොලැබේ. අයදුම්කරන අවස්ථාව වන විට පැවති අයදුම්කරුවන්ගේ තනතුර සහ සේවා ස්ථානය, විභාගය සම්බන්ධ සියලු කටයුතු සඳහා අදාළවන අතර, අයදුම්පත් එවීමෙන් පසු ඒ සම්බන්ධව සිදුවන වෙනස්වීම් කිසිවක් පිළිබඳව සලකනු නොලැබේ.

VI. අයදුම්පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධ ලිපියක් හෝ තැපෑලේ දී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි පිළිබඳ සලකා බලනු නොලැබේ.

VII. අයදුම්පත්‍ර ලද බව දන්වනු නොලැබේ.

VIII. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විසින් මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා, නිවේදනයට අනුව අදාළ සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ දී අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැතිබව අනාවරණය වුවහොත් ඔහුගේ / ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කෙරෙනු ඇත.

IX. විභාග මධ්‍යස්ථානය පිළිබඳව මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් අයදුම්කරුවන් වෙත විභාග ප්‍රවේශපත්‍රය මගින් දැනුම් දෙනු ලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන **www.psc.cp.gov.lk** මගින් පළකරනු ඇත. ප්‍රවේශපත්‍ර විභාගය පැවැත්වීමට දින 14 කට පෙර අයදුම්කරුවන්ගේ අයදුම්පතෙහි සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනයට විද්‍යුත් තැපැල මගින් හෝ අයදුම්කරු විසින් අයදුම්පතෙහි දක්වා ඇති ජංගම දුරකතන අංකය වෙත කෙටි පණිවිඩයක් (SMS) මගින් යොමු කරනු ලැබේ.

X. නිවේදනය පළවී දින 04 ක් 05 ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍ර නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබා ගත් අයදුම්පත්‍රයේ සහ මුදල් ගෙවූ කුවිතාන්සියේ ඡායා පිටපතක් ද, අයදුම්පත්‍රය ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, අතැතිව ඔබගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම නිවැරදිව සඳහන් කරමින් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ විභාග අංශය වෙතින් විමසිය යුතුය.

(දුරකතන අංකය : 081 – 2213097 )

11. අදාළ විභාග ගාස්තු ගෙවා, නිසි ලෙස අයදුම්පත්‍ර සම්පූර්ණ කර, නියමිත දිනට පෙර එවා ඇති සියලුම අයදුම්කරුවන් වෙත මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් විසින් තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍ර පළමුවෙන්ම විභාගයට පෙනී සිටින දින විභාග මධ්‍යස්ථාන භාර ශාලාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එවැනි ප්‍රවේශ පත්‍රයක් ඉදිරිපත් නොකරන කිසිදු අපේක්ෂකයෙකුට විභාගය සඳහා පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.

12. විභාගයට පෙනී සිටින සියලුම විභාග අපේක්ෂකයන් තමාට නියමිත විභාග මධ්‍යස්ථානයේ දී පමණක් විභාගයට පෙනී සිටිය යුතුය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන ඕනෑම දඬුවමකට යටත්වීමට ඔවුනට සිදුවනු ඇත.

13. ***අපේක්ෂකයාගේ අනන්‍යතාවය :***

මෙම විභාගයට අයත් සෑම විෂයය පරීක්ෂණයකදී ම විභාග ශාලාධිපතිවරයා සෑහීමකට පත්වන අයුරින් තම අනන්‍යතාව ඔප්පු කර සිටීමට අයදුම්කරුවන් ක්‍රියා කළ යුතුය. මේ සඳහා පහත දැක්වෙන කවර හෝ එක ලියවිල්ලක් ප්‍රමාණවත් වේ.

- පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කළ ජාතික හැඳුනුම්පත ;
- වලංගු රියදුරු බලපත්‍රය ;
- වලංගු විදේශ ගමන් බලපත්‍රය ;
- එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව කහවුරු කරගත හැකිවන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කරගනු නොලැබේ ;
- තව ද, විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි වන පරිදි මුහුණු හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

14. ***සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම :***

14.1. මෙම විභාගයට අදාළ රෙගුලාසි අනුව කිසියම් අපේක්ෂකයෙකු ඊට පෙනී සිටීමට නුසුදුසු වෙතැයි පෙනී යන ලද නම්, විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ ඊට පසු හෝ යන කවර අවස්ථාවක දී වුවද ඔහුගේ /ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබිය හැකිය.

14.2. අපේක්ෂකයෙකු විසින් සපයන ලද තොරතුරු පසු කලෙකදී වැරදි බව පෙනී ගියහොත් හෝ ඔහු /ඇය විසින් හිතාමතාම කිසියම් කරුණක් වසන් කරන ලද බව අනාවරණය වුවහොත් හෝ ඔහු /ඇය වෙත තවදුරටත් පත්වීමක් ලබා දීම සම්බන්ධයෙන් සලකා බලනු නොලබන අතර, මෙම විභාගය හේතුකොටගෙන දී තිබූ පත්වීම අහෝසි කිරීමට හෝ රජයේ සේවයෙන් පහකිරීමට වුවද යටත් වේ.

15. අයදුම්කරුවන්ගේ විභාග ප්‍රතිඵල මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන www.psc.cp.gov.lk මගින් පළ කරනු ඇත.

16. මෙම නිවේදනයේ ආවරණය වන/නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳව තීරණය කිරීමේ අයිතිය ද මෙම විභාගය පැවැත්වීම පිළිබඳව හෝ පැවැත්වීමෙන් පසුව තෝරාගැනීම් කිරීම/නොකිරීම හෝ පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳව අවසාන තීරණය මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය. එසේම මෙම නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කිසියම් කරුණක් වෙතොත් ඒ ගැන පැහැදිලි කිරීම / තීරණය කිරීම මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

17. මෙම බඳවා ගැනීම සම්බන්ධ විස්තර මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන www.psc.cp.gov.lk හි පළකර ඇති අතර, අදාළ අයදුම්පත්‍රය එහි දී බාගත කරගත හැකිය.

18. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්වෙනු ඇත.

මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

සුජානි ආර්.විජේතුංග,<br>
ලේකම් (*වැ.බ*),<br>
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,<br>
මධ්‍යම පළාත් සභාව.

2025 ජූලි මස 02 වැනි දින,<br>
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,<br>
අංක 244, කටුගස්තොට පාර,<br>
මහනුවර.

ආදර්ශ අයදුම්පත්‍රය

**මධ්‍යම පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ කෘෂිකර්ම උපදේශක III ශ්‍රේණිය සඳහාවන විවෘත බඳවා ගැනීම - 2025 වර්ෂය**

විභාග අංකය :- ☐

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය (අදාළ අක්ෂරය කොටුව තුළ ලියන්න.)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :- ☐ (සිංහල - S , දෙමළ - T, ඉංග්‍රීසි - E)

(අදාළ මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.)

01. 1.1 මුලකුරු සමග නම :- ..........................................................................................................
Mr./Mrs./Miss (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
(*උදා* :- SILVA A.B.C.D.)

1.2 මුලකුරු සමග නම :-..........................................................................................................
මයා/මිය/මෙනවිය (සිංහලෙන්/දෙමළෙන්)

1.3 මුලකුරුවලින් හැඳින්වෙන නම් (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :-..........................................................................

1.4 මුලකුරුවලින් හැඳින්වෙන නම් (සිංහලෙන්/දෙමළෙන්) :-..........................................................................

02. 2.1 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :-..........................................................................................

2.2 විද්‍යුත් තැපැල් ලිපිනය :-..........................................................................................................

2.3 ජාතික හැඳුනුම්පත් අංකය :- ☐☐☐☐☐☐☐☐☐☐☐☐

2.4 ස්ත්‍රී/පුරුෂ භාවය : 0 -පුරුෂ , 1- ස්ත්‍රී ☐

2.5 විවාහක/අවිවාහක බව :- අවිවාහක - 1 විවාහක - 2 ☐ (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

03. 3.1 උපන් දිනය :- | Y | Y | Y | Y | M | M | D | D |

3.2 අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට : (2025.07.31) වයස :- අවු : .............. මාස : ................. දින : ......................

3.3 දුරකතන අංකය : ජංගම:- ☐☐☐☐☐☐☐☐☐☐ ස්ථාවර:- ☐☐☐☐☐☐☐☐☐☐
(විභාගය සම්බන්ධව දැනුම්දීම සඳහා)

04. අයදුම්කරු ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය:-..........................................................................

| *ඡන්දහිමි නාම ලේඛනයට අනුව පදිංචිය* | *2022* | *2023* | *2024* |
|---|---|---|---|
| මැතිවරණ කොට්ඨාසය | | | |
| ඡන්ද ප්‍රදේශය | | | |
| ඡන්ද කොට්ඨාසය | | | |
| ග්‍රාම නිලධාරි කොට්ඨාසය | | | |
| ගෘහ අංකය | | | |
| නමට ඉදිරියෙන් ඇති අනුක්‍රමික අංකය | | | |

05. කාලත්‍රයාගේ ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය (අයදුම්කරු මෙම පළාතේ වසර 03 කට වඩා ස්ථිර පදිංචි අයෙකු සමග විවාහ වූ විට) :-
..........................................................................................................................................................................

| *ඡන්දහිමි නාම ලේඛනයට අනුව පදිංචිය* | *2022* | *2023* | *2024* |
|---|---|---|---|
| මැතිවරණ කොට්ඨාසය | | | |
| ඡන්ද ප්‍රදේශය | | | |
| ඡන්ද කොට්ඨාසය | | | |
| ග්‍රාම නිලධාරී කොට්ඨාසය | | | |
| ගෘහ අංකය | | | |
| නමට ඉදිරියෙන් ඇති අනුක්‍රමික අංකය | | | |

06. අධ්‍යාපන සුදුසුකම්:-

06.1 අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගය:-

වසර :................. විභාග අංකය :.......................

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

06.2 අ.පො.ස (උසස් පෙළ) විභාගය:-

වසර:-................ විභාග අංකය:-..................

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |

07. වෘත්තීය (තාක්ෂණ) සුදුසුකම්:- (වෘත්තීය සුදුසුකම් සනාථ කෙරෙන ලේඛනවල සහතික කළ පිටපත් ඇමිණිය යුතුය.)

| *ආයතනය* | *හදාරා ඇති පාඨමාලාව* | *පාඨමාලාවේ කාල සීමාව* | *NVQ මට්ටම* | *NVQ සහතිකපත් අංකය* | *සහතිකපත් අංකය හා වලංගු දිනය* |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |

08. වෙනත් සුදුසුකම්:-
..........................................................................................................................................................................
..........................................................................................................................................................................
..........................................................................................................................................................................
..........................................................................................................................................................................

09. ඔබ යම් ආබාධයකින් පෙළෙන්නේ ද? :..........................................................................................................................
"ඔව්" නම් ඒ පිළිබඳ තොරතුරු :..........................................................................................................................
..........................................................................................................................................................................
..........................................................................................................................................................................

10. විභාග ගාස්තු රු: 600/- ගෙවීම පිළිබඳ තොරතුරු :

i. විභාග ගාස්තු ගෙවූ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නම :-..........................................................................................
ii. දිනය :- ..........................................................................................................................................
iii. කුවිතාන්සි අංකය :- ..........................................................................................................................................

| |
|---|
| මුදල් ගෙවූ ලදුපත නොගැලවෙන සේ මෙම කොටුව තුළ අලවන්න.<br>( ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ) |

11. ඔබ කිසියම් වරදකට උසාවියෙන් දඬුවම් ලබා තිබේ ද ?..........................................................................................
"ඔව්" නම් විස්තර දක්වන්න :- ..........................................................................................................

**අයදුම්කරුගේ ප්‍රකාශය**

12. මෙම අයදුම්පතේ මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි. මෙහි සඳහන් කරුණු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව අනාවරණය වුවහොත් මා සේවයට බඳවා ගැනීමට නුසුදුස්සකුවන බවත්, පත්වීමක් ලැබීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් සේවයෙන් පහකිරීමට යටත්වන බවත් මා දනිමි. තව ද ,විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ප්‍රකාශ කරමි.

| | |
|---|---|
| ................................ | .............................................., |
| දිනය. | අයදුම්කරුගේ අත්සන. |

13. **අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :**

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ................................................................................... මහතා/ මහත්මිය/ මෙනෙවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද ඔහු/ඇය මා ඉදිරිපිට දී .............................. දින ඔහුගේ /ඇයගේ අත්සන තැබූ බවත්, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවත් එම ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

| | |
|---|---|
| ................................... | ........................................................................, |
| දිනය. | අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.<br>(නිලමුද්‍රාව සමග) |

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම:- ..........................................................
තනතුර:- ……………………………….......................................……………
ලිපිනය:- ……………..........................................…………………………………

07 - 677

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.